රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 23/2023

මගේ අංකය : EST-6/03/LEA/1061
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2023.12.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයන් සඳහා නිවාඩු ලබා දීම**
**2023 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර්**

2023 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දිවයිනේ විවිධ ප්‍රදේශවල ඇති වූ ජල ගැලීම්/ ගංවතුර හා නායයෑම් හේතුකොට ගෙන සේවයට වාර්තා කිරීමට අපොහොසත් වූ පහත සඳහන් රාජ්‍ය නිලධරයන් සඳහා විශේෂ නිවාඩු ලබා දීමට තීරණය කර ඇත.

I ඉහත කරුණු මත සිය පදිංචි ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පොදු ප්‍රවාහන සේවා ඇනහිටීම නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වූ නිලධරයන්

II මාර්ග අවහිර වීම හේතුවෙන් හෝ ඇති වූ ව්‍යසනයන්ගෙන් විපතට පත්වීම හේතුවෙන් හෝ අවතැන් වීම හේතුවෙන් හෝ සේවයට වාර්තා කිරීමට නොහැකි වූ නිලධරයන්

02. අදාළ නිලධරයා විසින් විශේෂ නිවාඩු ලබා ගැනීම සඳහා, තමාට රාජකාරියට වාර්තා කිරීමට නොහැකි වූ හේතුව ද සඳහන් කරමින් මේ සමඟ අමුණා ඇති ආකෘතිපත්‍රය ප්‍රකාරව, ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද තම ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීගේ නිර්දේශය සහිත ඉල්ලීම ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. ආයතන ප්‍රධානියා, ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද නිලධරයාගේ ඉල්ලීම පරීක්ෂා කර එහි නිරවද්‍යතාව පිළිබඳ පෞද්ගලිකවම සෑහීමකට පත්විය හැකි නම්, නිලධරයාගේ පාලනයෙන් බැහැරව ඉහත හේතු යටතේ සේවයට වාර්තා කිරීමට නොහැකි වූ දින ගණන සඳහා පමණක් විශේෂ නිවාඩු අනුමතිය සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

04. මෙසේ ලබාදෙන විශේෂ නිවාඩු අදාළ ආයතනයේ පවත්වාගෙන යනු ලබන නිවාඩු ලේඛනයේ සුදුසු පරිදි ඇතුළත් කළ යුතු අතර, මෙම අනුග්‍රහය 2023 වර්ෂයේ සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල දිවයිනේ විවිධ ප්‍රදේශවල ඇති වූ ජල ගැලීම්/ ගංවතුර හා නායයෑම් නිසා සේවයට වාර්තා කිරීමට නොහැකි වූ නිලධරයන් සඳහා පමණක් සීමා කර ලබා දිය යුතු ය.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-699399
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-vi@pubad.gov.lk

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2023 අනුව, ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතුකොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයන් සඳහා විශේෂ නිවාඩු ඉල්ලුම් කිරීමේ ආකෘතිපත්‍රය - 2023 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර්**

01. නිලධරයාගේ සම්පූර්ණ නම : .....................................................................................................

02. තනතුර : .....................................................................................................................

03. අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ / පළාත් සභාවේ නම : ....................................................

.....................................................................................................................

04. සේවා ස්ථානයේ ලිපිනය : .....................................................................................................

.....................................................................................................................

05. පදිංචි ලිපිනය :

ස්ථිර : .....................................................................................................................

.....................................................................................................................

තාවකාලික : .....................................................................................................................

.....................................................................................................................

06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .....................................................................................

07. සේවයට වාර්තා කිරීමට නොහැකි වූ හේතුව :

ජල ගැලීම්/ ගංවතුර ☐ නායයෑම් ☐ මාර්ග අවහිරතා ☐

08. නිලධරයා සමඟ ආපදාවට ලක් වූ පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව : .......................................

09. ආපදාවට පෙර අවසන් වරට සේවයට වාර්තා කළ දිනය : .......................................

10. ආපදාවෙන් පසු සේවයට වාර්තා කළ දිනය : .......................................

11. නිවාඩු ඉල්ලුම් කරන දින ගණන : .......................................

12. දිනය : ......................... නිලධරයාගේ අත්සන : .......................................

13. ග්‍රාම නිලධාරීගේ නිර්දේශය :

ඉහත නම් සඳහන් ........................................................................................ මයා/මිය/මෙනෙවිය මාගේ ග්‍රාම සේවා වසමේ ස්ථිර පදිංචිකරුවෙකු වන අතර ඔහු විසින් ආපදා තත්ත්වයට අදාළව ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැවින් නිවාඩු ඉල්ලීම නිර්දේශ කරමි.

නම : ............................................................

දිනය : .............................. අත්සන: ...............................

(නිල මුද්‍රාව යොදන්න)

14. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය :

ඉහත නිර්දේශය හා එකඟ වෙමි/ එකඟ නොවෙමි. නිවාඩු ඉල්ලීම නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

දිනය : ............................... අත්සන: ............................

(නිල මුද්‍රාව යොදන්න)

15. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය : නිවාඩු නිර්දේශ කරමි/ නිර්දේශ නොකරමි.

දිනය : ............................... අත්සන: ............................

(නිල මුද්‍රාව යොදන්න)

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය : නිවාඩු අනුමත කරමි/ නොකරමි.

නම : ....................................................................

තනතුර : ....................................................................

දිනය : ............................... අත්සන: ...............................

(නිල මුද්‍රාව යොදන්න)